# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2259/34 - 2021 දෙසැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2021.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

6 වන සංශෝධනය

**ශ්‍රී ලංකා විගණන සේවයේ සේවා ව්‍යවස්ථාව**

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධනය කරන ලද 1989 දෙසැම්බර් මස 11 දිනැති අංක 588/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා විගණන සේවය පිළිබඳ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී. මෙම සංශෝධිත විධිවිධානයන් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණය ගනු ලැබූ 2021 සැප්තැම්බර් මස 13 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 දෙසැම්බර් මස 22 වැනි දින.

I **කොටස :**

| | |
|---|---|
| සංශෝධන අංක 01 | - 1997 සැප්තැම්බර් මස 19 වැනි දින හා අංක 993/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 02 | - 1998 දෙසැම්බර් මස 04 වැනි දින හා අංක 1056/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 03 | - 2008 අගෝස්තු 20 වැනි දින හා අංක 1563/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 04 | - 2015 මාර්තු 04 වැනි දින හා අංක 1904/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 05 | - 2017 අගෝස්තු 09 වැනි දින හා අංක 2031/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* |

II **කොටස :**

2. දැනට පවතින ඡේදයේ සඳහන් 2. (I) සහ (II) යන කොටස් තුළ ඇතුළත්වන ශ්‍රේණි වැටුප්, සේවක සංඛ්‍යාව හා තනතුරු නාම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(I). ***සේවා ගණයට අදාළ තොරතුරු :-***

| *සේවා ගණය* | *තනතුරු නාමය* | *වැටුප් කේතය* | *ආරම්භක වැටුප් පියවර* | *තනතුරු සංඛ්‍යාව* |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ විධායක | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති | AS-04 | 1 පියවර | 03 |
| | නියෝජ්‍ය විගණකාධිපති | | 1 පියවර | 15 |
| විධායක | ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති | AS-03 | 20 පියවර | 72 |
| | සහකාර විගණකාධිපති | | 12 පියවර | 455 |
| | විගණන අධිකාරී | | 1 පියවර | |

(II). ***වැටුප් පරිමාණ*** : ජ්‍යෙෂ්ඨ විධායක - AS-04
රු. 88,000-12X2,700-120,400

විධායක - AS-03
රු. 47,615-10X1,335-8X1,630-17X2,170-110,895

3. මෙම ඡේදයේ සඳහන් උසස්වීම් ලබා දීමේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/1274/301/017 දරන, විගණන දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම" මැයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2021 ජූලි මස 8 දිනැති සංදේශය සඳහා ලබා දී ඇති 2021 සැප්තැම්බර් මස 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති, නියෝජ්‍ය විගණකාධිපති, ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, සහකාර විගණකාධිපති තනතුරුවල පුරප්පාඩු පිරවීමේ දී ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය යන නිර්ණායකයන්ගෙන් ජ්‍යෙෂ්ඨත්වය පමණක් සළකා උසස්වීම් සිදුකරනු ලැබේ.

මෙම උසස්වීම් ලබාදීමේ දී සළකා බලනු ලබන අනෙකුත් අවශ්‍යතා තවදුරටත් අදාළ වේ.

EOG 12 - 0252

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.